# WE DELIVER RESULTS...

Australian Migration

**Susantha Katugampala**
LL.B (Monash)

**Barrister & Solicitor**
Registered Migration Agent 96/86306

*Australian Qualified Sri Lankan Lawyer - Melbourne, Australia.*
*Sri Lankan Community Awards Winner - Australia.*

**FAIRFIELDS**
IMMIGRATION LAWYERS

Australia:

10 Morrison Place, East Melbourne,
Victoria 3002, Australia.
Tel: +61 3 9650 4557
Fax: +61 3 9650 4559

Sri Lanka:

3 Melbourne Avenue, Colombo 04.
Tel: 011 2555693
Fax: 011 2555694
Mobile: 0777 347670

Email: fairfields.lawyers@bigpond.com


තනතුරු ලබාගත යුතු බවට ප්‍රකාශ කරන රාජිත සේනාරත්න මහතා වැනි අයෙක් එයට සහභාගි නොවීම එක් පැත්තකින් ගැටළු සහගත තත්ත්වයකි. රාජිත සේනාරත්න මහතා ඉන්නේ එ.ජා.ප.ය හා ආණ්ඩුව එකතු වී රටේ ප්‍රශ්න විසඳිය යුතුයි යන මතයේය. නමුත් එස්.බී. දිසා-නායක මහතා ඉන්නේ වෙනත් මතයකය. ඔහු ආණ්ඩුවට එකතු වෙමුයි යන කාරණේ නැත.

ආණ්ඩුව සහ එ.ජා.ප.ය එකතුවීම කෙරෙහි ඔහුගේ එතරම් කැමැත්තක් නැත. ඔහු ප්‍රකාශ කරන්නේ ආණ්ඩුවට එකතු නොවී, එ.ජා.ප.ය පූර්ණ ප්‍රතිසංවිධානයට ලක්කර ජනතාව පක්ෂය වටා ඒකරාශී කර පක්ෂය ශක්තිමත් කර එ.ජා.ප. ආණ්ඩුවක් ඇතිකර ගැනීම උදෙසා පෙරමුණ ගතයුතු බවය. එසේ නොමැතිව එකිනෙකා ආණ්ඩු පක්ෂයේ එල්ලී ගොස් එ.ජා.ප.යට අත්වන සෙතක් නැති බව එස්.බී. දිසානායක මහතාගේ මතය වේ. එය කෙටි කාලීනව කෙසේ වෙතත්, දීර්ඝ කාලීනව සරු අස්වැන්නක් ලබා ගතහැකි වැඩපිළිවෙළක් බව ඔහුගේ මතය වනු ඇත.

ඊටත් මහින්ද රාජපක්ෂ හා ජ.වි.පෙ. ගිවිසුම් ගසා අවසානයේ අත්කර ගත් ප්‍රතිඵල පිළිබඳ කිසියම් අවබෝධයක් එස්.බී. දිසානායක මහතාට ඇත. එම දෙපාර්ශ්වය ගිවිසුම් ගැසීමෙන් අවසානයේ අත්වුණේ කුමන ඉරණමක්ද?

මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ශක්තිමත් වී ජ.වි.පෙ. දුර්වල කිරීම පමණි. එම දුර්වල කිරීම කොතෙක්ද, කිවහොත් ජ.වි.පෙ. ප්‍රබල මන්ත්‍රීවරුන් වූ සිරිපාල අමරසිංහ හා නන්දන ගුණතිලක යන අයව පවා සිය කඳවුර වෙත නම්මවා ගන්නට මහින්ද රාජපක්ෂ මහතා සමත් විය.

එපමණක් නොව, ජ.වි.පෙ. සහ එහි පාක්ෂිකයන් අතර යම් යම් ප්‍රශ්නකාරී තත්ත්වයන් ඇති කිරීමට පවා රාජපක්ෂ ආණ්ඩුව ක්‍රියා කර ඇත. ඒ අතර ජ.වි.පෙ. ඇතැම් මන්ත්‍රීවරුන් ආණ්ඩු පක්ෂය වෙත බිලි බා ගෙන මැති ඇමැති තනතුරු පවා ලබාදීමේ සුක්ෂම වැඩ පිළිවෙළක් පවා ආණ්ඩුව තුළ ක්‍රියාත්මක වේ.

එබැවින් ජ.වි.පෙ.ට ඇති කළ අනපේක්ෂිත තත්ත්වයන් රාජපක්ෂ ආණ්ඩුව එ.ජා.ප.ය තුළත් ඇති කිරීමට බැරි නැත. දැනටමත් ඇති කර නැතුවා නොවේ. ඉන් රාජපක්ෂ ආණ්ඩුව උත්සාහ කරන්නේ ජ.වි.පෙ. මෙන් එ.ජා.පයත් දුර්වල කර ආණ්ඩුව ශක්තිමත් කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීමය. එබැවින් එස්.බී. දිසානායක ප්‍රකාශ කරන්නේ ජ.වි.පෙ.ට සිදුකළ දේවල් වලින් පාඩම් ඉගෙන ගෙන එ.ජා.ප.ය එම බොරු වළේ නොවැටී ඉදිරියට යායුතු බවය. එය කොතෙක් ප්‍රායෝගිකද? යන්න ප්‍රකාශ කිරීමට අපහසුය.

රාජිත සේනාරත්න, එස්.බී. දිසානායක, මහින්ද විජේසේකර යන අය රනිල් වික්‍රමසිංහ විරෝධී කඳවුරේ වුණත්, ඔවුන් අතරත් විවිධ දේශපාලන පරස්පරතා ඇත. ඒ අතරින් එස්.බී. හා මහින්ද විජේසේකර ඉන්නේ එ.ජා.ප. ආණ්ඩුවට එකතු නොවිය යුතු යන මතයේය. නමුත් රාජිත සේනාරත්න ඉන්නේ ඊට වෙනස් මතයකය. එනම්, ඔහු ඉන්නේ එකතුව හොඳයැයි යන මතයේය. එසේ නම් රාජිත සේන-ාරත්න ගිවිසුම් අත්සන් කරන අවස්ථාවට නොපැමිණියේ ඇයි? ඊළඟට මතුවන ප්‍රශ්නයයි.



එම ප්‍රශ්නය පසුගියදා රාජිත සේනාරත්න මහතා "දෙරණ" රූපවාහිනී සේවය සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡාවකදීද ඉස්මතු විය. එවිට ඔහු ප්‍රකාශ කළේ "එම අවස්ථාවට සහභාගි වන වෙලාවේ මට මගේ අහිංසක දුප්පත් ජනතාව වෙනුවෙන් වැඩක් කිරීම ප්‍රයෝජනවත් බවය."

නමුත් ඔහුගේ ප්‍රකාශයට යටින් බරපතල කරුණක් තිබිණි. ආණ්ඩුව සහ එ.ජා.ප.ය අතර ගිවිසුම සකස් කිරීමට මූලික කාර්ය භාර්ය කළේ කරු ජයසූරිය, රාජිත සේනාරත්න, ජී.ඇල්. පීරිස්, මිලින්ද මොරගොඩ කණ්ඩායමය. නමුත් එහි වාසිය ගැනීමට ක්‍රියා කළේ රනිල් වික්‍රමසිංහ, මලික් සමරවික්‍රම, තිස්ස අත්තනායක යන කණ්ඩායමය. එබැවින් ඒ කෙරෙහි රාජිත සේනාරත්න, කරු ජයසූරිය ඇතුළු පිරිස එතරම් කැමැත්තකින් සිටියේ නැත. කොටසක් බර අදින්නන්, තව කොටසක් පැත්තක සිට වාසි ලබා ගන්නටත්, ක්‍රියා කිරීම රාජිත සේනාරත්නගේ අමනාපයට හේතුවී තිබිණ. ඔහු ගිවිසුම් අත්සන් කරන අවස්ථාවට නොයෑම ඊට එක් හේතුවක් වන්නට ඇත.

ජ.වි.පෙ. හා මහින්ද රාජපක්ෂ මහතා ගිවිසුම් ගැසීමට පෙර හෝ ගිවිසුම් ගසන දින මෙවැනි අර්බුද තිබුණේ නැත. එබැවින් එය දිගු කල් පවතිනු ඇති බවට බොහෝදෙනා තුළ විශ්වාසයක් පැවැතිණි. එසේ විශ්වාස කළ ගිවිසුම වැඩිකල් නොගොස් විනාශ වුණේ නම්, එ.ජා.ප.යේ අර්බුද මැදින් අත්සන් කළ ගිවිසුමට යාහැකි දුර ඉතාම කෙටිවීමට බැරි නැත.

එදා මහින්ද රාජපක්ෂ ජ.වි.පෙ. ගිවිසුමට කිසියම් මට්ටමින් හෝ විරෝධය දැක්වූයේ අනුර බණ්ඩාරනායක, ඩිලාන් පෙරේරා, මහින්ද, නන්ද අලුත්ගමගේ සහ ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ වැනි අය පමණි. එයත් ප්‍රබල විරෝධයක් නොව, සාමාන්‍ය ගෙරවිල්ලකි. ගොරවන තරමට වහින්නේ නැති බව මහින්ද රාජපක්ෂ මහතා සිය දේශපාලන අත්දැකීම් වලින් හොඳට දනී. එම නිසා ඔහු ගෙරවිලිකාරයන්ගේ හඬට බය වුණේ නැත. ජ.වි.පෙ. සමඟ ගිවිසුම අත්සන් කළේය. එපමණක් නොව, එදත් අදත් මහින්ද රාජපක්ෂ මහතාගේ නායකත්වයට අභියෝග කිරීමට පුළුවන් චරිතයක් පක්ෂය තුළ නැත. හිටියේ අනුර බණ්ඩාරනායක මහතා පමණි. නමුත් ඔහු පක්ෂයේ බහුතරයක් දෙනා අතර අවලංගු කාසියකි. කළහැකි දෙයක් නැත. නමුත් එ.ජා.ප.ය තුළ ඇත්තේ ඊට වෙනස් ස්වභාවයකි. රනිල් වික්‍රමසිංහගේ නායකත්වයට අභියෝග කිරීමට පමණක් නොව, ඔහු පක්ෂ නායකත්වයෙන් ඉවත් කිරීමට තරම් පෙරමුණ ගත් චරිත එ.ජා.ප.ය තුළ සිටී.

එ.ජා.ප. නියෝජ්‍ය නායක කරු ජයසූරිය, එස්.බී. දිසානාය, රාජිත සේනාරත්න ඒ අතරින් කැපී පෙනෙන චරිත කිහිපයකි. එම නිසා රනිල් වික්‍රමසිංහට සිය දරදඬු ප්‍රතිපත්ති ඉදිරියේ කොතෙක්දුරට යා හැකිද? යන ප්‍රශ්නය මතුවේ. රනිල් වික්‍රමසිංහ මහතා ශ්‍රී.ල.නි.ප.ය සමඟ ගිවිසුම් ගැසීමට පෙරත්, ගිවිසුම් ගසන විටත්, ඉන් පසුවත් පක්ෂය තුළ ඊට අදාළ අර්බුද දිගින් දිගටම පැන නැගිණි. එම නිසා මෙම ගිවිසුමම හරහා දෙපාර්ශ්වයට එතරම් දුරක් යෑමට අපහසුය.



දෙපාර්ශ්වය එකතු වී ගිවිසුම් ගැසීමත් සමඟ එ.ජා.ප.ය තුළ අර්බුද තවත් ප්‍රබල විය. කොට-සක් මැති ඇමැති තනතුරු ලබාගත යුතු බවට ප්‍රකාශ කරන අතර, තවත් කොටසක් තනතුරු ලබා ගන්නවාට කැමැති නැත.

සජිත් ප්‍රේමදාස මහතා ප්‍රකාශ කරන්නේ තනතුරු වෙනුවට එක් මන්ත්‍රීවරයෙකුට රුපියල් ලක්ෂ 300 බැගින් විමධ්‍යගත අරමුදල හරහා මුදල් ලබා දියයුතු බවය. ඉන් ප්‍රදේශයේ ජනතාවට විශාල සේවයක් කළහැකි බව ඔහු කියයි. එසේ නොමැතිව මැති ඇමැති තනතුරු සියල්ලටම ලබා ගැනීමට බැරිය. ඉන් කොට-සකට අසාධාරණයක් වේ.

නමුත් සියළුම එ.ජා.ප. මන්ත්‍රීවරුන්ට ලක්ෂ 300 බැගින් ලබා දෙන්නේ නම්, ඉන් ජනතාවට කළහැකි සේවය වැඩි බව ඔහු කියා සිටින්නේ තනතුරු භාර ගැනීමට උත්සුක වන අයගේ සිත්සතන් පළුදු කරවමිනි.

නමුත් එයට කොතෙක් දුරට සාර්ථක වේද? යන්න ප්‍රකාශ කිරීමට අපහසුය. ආණ්ඩු පක්ෂයේ මැති ඇමැතිවරුන් වුණත්, තමන්ගේ තනතුරු හෝ එහි කොටස් එ.ජා.ප.ය වෙනුවෙන් පූජා කිරීමට කැමැති නැත. මෙවැනි පසුබිමක් තුළ ශ්‍රී.ල.නි.ප. එ.ජා.ප. අවබෝධතා ගිවිසුමත් කව්රුන් කෙසේ තර්ක විතර්ක ඉදිරිපත් කළත් යා හැකි දුරනම්, ඉතා කෙටි බව නොකියා බැරිය.

කව්රුන් අපහසුතාවයට පත්වුණත්, කව්රුන් කණගාටු වුණත්, කව්රුන් වෛර බැන්දත්, කව්රුන් දෝෂාරෝපණ එල්ල කළත්, ඒ දෙය නොපැකිළිව කිව යුතුය. මන්ද, ඇත්ත කතාව එය බැවිනි.

- ශ්‍රී ලාල් ප්‍රියන්ත -